# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2447/24 – 2025 ජූලි මස 29 වැනි අඟහරුවාදා – 2025.07.29**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/190.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.03.18 දිනැති හා අංක 2376/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.03.13 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වේයන්ගොඩ, උතුවම් බෝගහවත්ත, සුසිරිපාය, අංක 71 හි පදිංචි පී. ඒ. බෝගොඩ මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 13, බ්ලුමැන්ඩල් පාර, අංක 223 හි පිහිටි උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 11/2024 හා 2025.03.10 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අප්‍රේල් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*යොමු අංකය*: IR/COM/05/2018/190

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.**

පී.ඒ.බෝගොඩ මයා,
අංක: 71. සුසිරිපාය,
උතුවම් බෝගහවත්ත, වේයන්ගොඩ.

*පළමු පාර්ශ්වය*

නඩු අංකය : A/11/2024

සහ

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක.223,
බ්ලූමැන්ඩල් පාර,
කොළඹ 13.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවතින ආරාවුල.

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා 2024.03.13 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කාරණය**

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ:

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ 1986.12.01 සිට 2017.02.28 දින දක්වා සේවය කළ පී. ඒ. බෝගොඩ මහතාට පාරිතෝෂික මුදල් ගෙවීමේදී වසරකට මාසයක වැටුප පදනම් කරගෙන නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ. නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.

පළමු පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ කේ. බී. ජී. ප්‍රේමදාස මහතා පෙනී සිටි අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ සමූහ මානව සම්පත් කළමණාකරු නෙරන්ජන් ෆොන්සේකා මහතා සමඟින් නීතිඥ ඉල්හාම් මහතා පෙනී සිටින ලදී.

පළමුව මෙම කරුණ සම්බන්ධව සමථයක් තිබේ දැයි දෙපාර්ශ්වයෙන් ම විමසීම් කරන ලදී. දෙපාර්ශ්වයෙන්ම එකඟතාවය ඇති සමථයක් සඳහා එළඹීමට නොහැකි විය.

පළමු පාර්ශ්වය තම පළමු ප්‍රකාශය (පිටුව 8,9.10) මඟින් පිටුව 10 (අවසාන ඡේදය) පරිචයක් ලෙස පළමු පාර්ශ්වකරුට සමකාලීනව හෝ ඊට පෙර විශ්‍රාම ගනු ලැබූ සේවකයින්ට එක් සේවා වර්ෂයකට මාසයක වැටුප පදනම් කොට ගෙන පාරිතෝෂිකයක් ගෙවා ඇති බවත් පිටු අංක 09 හි 03 වන ඡේදය තමා දන්නා සේවයෙන් ඉවත් වූ හෝ සේවයෙන් විශ්‍රාම ගිය සියලු සේවකයන්ට වර්ෂයක් සඳහා මාසය බැගින් ගණන් බලා වඩා වැඩි පාරිතෝෂිකයක් ගෙවූ බැව් පළමු පාර්ශ්වය ප්‍රකාශ කරයි.

2024.08.30 දිනැති ප්‍රති ප්‍රකාශය මඟින් දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරනුයේ (පිටු අංක 11,12)12 පිටුවේ b අක්ෂරය මඟින් ත්‍යාගයක් ලෙස නීතිමය යුතුකමක් නොමැති ලබා දීමක් ලෙස අන්තිම වැටුපෙන් භාගයක් සේවය කළ වර්ෂ ගණනින් වැඩි කර ගෙවූ බවත් 12

පිටුවේ 02 ලාභාංශ වැඩි අවස්ථාවලදී ඉහත දීමනාව ගෙවූ බවත් ආයතනය පාඩු ලබන විට එම වැඩිපුර ගෙවීම් නැති කල බවත් ප්‍රකාශ කරයි.

පළමු පාර්ශ්වය වෙනුවෙන් පී. ඒ. බෝගොඩ මහතා සාක්ෂි ලබා දුන් අතර P1 සිට P3 දක්වා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන ලදී.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිකරුවන් 03 දෙනෙකු සාක්ෂි ලබා දුන් අතර වී1 ලෙස පිටු 11 න් සමන්විත ගිණුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලදී.

මෙයට අමතරව දෙපාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද පළමු ප්‍රකාශ සහ අවසන් ලිඛිත සැලකිරීම් සහ ඇමුණුම් ප්‍රදානය ලබා දීමේදී සැලකිල්ලට ගන්නා ලදී.

ඉල්ලුම්කරුගේ සේවා කාලය සේවය අවසාන මාසයේ වැටුප සහ වර්ෂයකට මාස 1/2 බැගින් ගෙවන ලද පාරිතෝෂික මුදල සම්බන්ධව දෙපාර්ශ්වයම පිළිගනී.

මෙහිදිම විසින් පළමුව සැලකිල්ලට ගත යුතු වනුයේ ඉල්ලුම්කරුට පාරිතෝෂික මුදල් ගෙවීමේදී වසරකට මාසයක වැටුප පදනම් කර නොගෙන වසරකට මාස 1/2 වැටුප පදනම් කරගෙන පාරිතෝෂික ගෙවීමෙන් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු වී තිබේද යන්නයි.

2024.09.09 දින ඉල්ලම්කරු වන පී. ඒ. බෝගොඩ සාක්ෂි දෙමින් පාරිතෝෂික ලබා ගන්නා අවස්ථාවේ තමාට සම්පූර්ණ පාරිතෝෂික මුදල නොලැබුණ නිසා තමන්ට පාරිතෝෂික මුදලින් 1/2 ලැබුණු බවට සටහනක් යොදා මුදල් භාරගත් බැව් ප්‍රකාශ කොට ඇත. එසේම පාරිතෝෂික මුදලේ ඉතිරි කොටස තමන්ට ලැබෙයි කියා විශ්වාසයක් තිබූ නිසා මුදල භාරගත් බැව්ද ප්‍රකාශ කරයි.

පිටු අංක 23 ඡේද අංක 06.

උ: ඒ චෙක් එක දෙනකොට මම කිව් මෙම මුදල නෙමේ අවුරුද්දට මාසයක් ගණනය කරන මුදල ලැබෙන්න ඕනේ කියලා. ඒ නිලධාරි කීවා ඉතිරි මුදල අපි ගෙවනවා මෙම මුදල ගන්න කියලා. එතකොට මම ඒ අය දුන්න කොළේ සටහනක් දැම්මා. මට ලැබෙන්න ඕන මුදලින් හරි අඩක් මම ලබා ගතිමි කියලා.

පිටු අංක 17

ප්‍ර. ඒ අනුව තමුන් විශ්වාස කරගෙන ඉන්නවා ඒ භාගය වැටෙයි කියලා?

උ. ඔව්

මෙදින සාක්ෂි දෙමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කරන්නේ පාරිතෝෂික මුදල් ලබා දුන් ජීවා මිස් ඉතිරි 1/2 ලැබෙයි කියලා ප්‍රකාශ කළ බවයි. ජීවා මිස් වාචිකව ප්‍රකාශ කල බවක් ඉල්ලුම්කරු ප්‍රකාශ කරයි. (පිටුව 19 ඡේද 7,8,9,10,11)

ඉල්ලුම්කරුගේ සාක්ෂියේදී ඔහු මතු කරන කරුණු අතර ජීවා මිස්ගේ වාචික පොරොන්දුව සහ පාරිතෝෂික ලබා ගැනීමේදී ඔහු විසින් ගෙවන ලද සටහන ගැන සඳහන් කරයි.

2024.10.21 දින තෙවන සාක්ෂිකරු වන ජීවා මිස් සාක්ෂි දෙමින් ඇය එවැනි වාචික පොරොන්දුවක් ලබා නොදුන් බැව් ප්‍රකාශ කරයි. පිටුව ( 46 ) 13 ඡේදය

ඉල්ලුම්කරු ප්‍රකාශ කරන්නේ තමාට වාචික පොරොන්දුවක් ලබා දුන් නිසා සටහනක් යොදා මුදල් ලබා ගත් බවයි. ජීවා මිස් ප්‍රකාශ කරන්නේ තමා එවැනි ප්‍රකාශයක් නොකළ බවයි. ජීවා මිස් දැනටමත් ආයතනයේ සේවය කරන තැනැත්තියෙකි. මෙබැවින් ඇය තමා දැනටමත් සේවය කරන ආයතනයට විරුද්ධ මතයක් දරාවිද යන්න පිළිබඳව බේරුම්කරණ අධිකරණයට සැකසංකා මතු වේ.

එසේම තමා මුදල් ලබා ගත් අවස්ථාවේ මුදලින් භාගයක් ලබා ගත් බවට සටහනක් යෙදූ බැව් ඉල්ලුම්කරු ප්‍රකාශ කරයි. ඉල්ලුම්කරුගේ එම ප්‍රකාශය දෙවන පාර්ශ්වයේ අභියෝගයට ලක් නොවුන අතර මුදල් ලබාදීමේදී අත්සනක් යොදා මුදල් ලබා ගත් එම ලේඛනය දෙවන පාර්ශ්වය ඉදිරිපත් කලේ හෝ ජීවා මියගෙන් සාක්ෂි ලබාගැනීමේදී ඒ සම්බන්ධව විමසීමක් හෝ දෙවන පාර්ශ්වය විසින් නොකරන ලදී.

ඉල්ලුම්කරු මුදල් ලබා ගැනීමේදී එසේ සටහනක් නොයෙදුවේ නම් එම ලේඛනය ඉදිරිපත් කිරීමේ හැකියාවක් දෙවන පාර්ශ්වයට තිබුණි. එහෙත් මුදල භාර ගත් බවට අත්සනක් යොදා එම ලේඛන බේරුම්කරණ විභාගයේදී ඉදිරිපත් නොවීය. ඉල්ලුම්කරු එම සටහන තැබීමෙන් තම පාරිතෝෂික මුදලේ ඉතිරි භාගය ලබා ගැනීමේ අවශ්‍යතාවයක් විශ්වාසයක් ඔහු තුළ තිබූ බවයි.

2024.09.30 දින දෙවන පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ සමූහ මානව සම්පත් නිලධාරි නෙරන්ජන් ෆොන්සේකා මහතා සාක්ෂි දෙමින් මෙම ආයතනයේ වසර 40 ක සේවා කාලයක් ඔහුට ඇති බවත් 2016 දී පාරිතෝෂික දීමනාව ගණනය කිරීම වෙනස් කරන තුරුම වර්ෂයකට මාසය බැගින් වන සේ ගණන් බලා ගෙවූ බවත් ප්‍රකාශ කරයි.

පිටුව 37 අවසාන ඡේදය

ප්‍ර. මෙම ආයතනයේ පාරිතෝෂික දීමනාව මාසික වැටුපෙන් 100%ක් වැඩ කරපු අවුරුදු ගණනෙන් වැඩි කරලා දුන්නේ මොන අවුරුද්ද වෙනකම්ද?

පි. 2016 (පිටුව 36 ඡේදය 01)

ප්‍ර. සමූහයේ හැමෝටම දුන්නා ? (38 පිටුව)

පි. ඔව් (36 පිටුව)

පළමු පාර්ශ්වයේ හරස් ප්‍රශ්න කිරීම්වල දී මෙම සාක්ෂිකරු (පිටුව 32).

ප්‍ර. 2016 න් පස්සේ මෙය ගෙවන්නේ නැහැ කියලා සේවකයින් දැනුවත් කළාද? (පිටුව 32 ඡේදය 2)

පි. වාචිකව දැනුවත් කළා. සමහරුන්ට ලිඛිතව ඉදිරිපත් කළ අවස්ථා තියෙනවා. (පිටුව 32 ඡේදය 3)

ප්‍ර. මේ නඩුවේ ඉල්ලුම්කරුට වාචිකව දැනුම් දුන්නද? පිටුව 32 ඡේදය 4

පි. හැම කෙනාම දන්නවා. පිටුව 32 ඡේදය 5

මේ අනුව පැහැදිලි වන්නේ ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දී නැති බවයි. එසේම ඉල්ලුම්කරුට වාචිකව දැනුම් දුන්නේද? යන ප්‍රශ්නයේදි සාක්ෂිකරු ප්‍රකාශ කරනු ලබන්නේ “ හැම කෙනාම දන්නවා “ යන්නයි.

ලිඛිතව හෝ වාචිකව මෙම වෙනස් වූ පාරිතෝෂික ගෙවීම් සම්බන්ධව ඉල්ලුම්කරු දැනුවත් භාවයක් නොමැති බැව් මින් තහවුරු වේ. සමූහ මානව සම්පත්ගේ සාක්ෂියේ 31 පිටුවේ අවසාන ඡේද දෙක

ප්‍ර. ඒ සේවකයින්ට කලින් වර්ෂය බැගින් පාරිතෝෂික ලැබුණා නම් ඒ ආකාරයට මේ සේවකයින්ට ලැබෙයි කියලා බලාපොරොත්තුවක් ඇති කර ගන්නට කියලා පැහැදිලියි නේ.

පි. ලැබෙයි කියලා

එසේම ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් පිටු අංක 17 - අවසාන ඡේදය

ප්‍ර. ඒ අනුව තමුන් විශ්වාස කරගෙන ඉන්නවා ඒ භාගය වැටෙයි කියලා ?

උ. ඔව්

දෙවන පාර්ශ්වයේ සමූහ මානව සම්පත්ගේ හා ඉල්ලුම්කරුගේ මෙම සාක්ෂිය අනුවද පැහැදිලි වන්නේ 100% වූ සම්පූර්ණ පාරිතෝෂික මුදලම තමන්ලාට ලැබෙයි කියා විශ්වාසයක් තිබූ බවයි. එම කරුණ සමූහ මානව සම්පත්ගේ සාක්ෂියේ පිටු අංක 31 .අවසාන ඡේද දෙක අනුවද පැහැදිලි වේ.

2016 වර්ෂයේ සිට පාරිතෝෂික මුදල වර්ෂයකට මාසයක් ගෙවන තීරණය බැව් (36) ආයතනයේ සමූහ මානව සම්පත් සාක්ෂියේදී ප්‍රකාශ කොට ඇත. පිටුව අංක 43 හි ආයතනයේ සහකාර කළමනාකරු සාක්ෂි දෙමින් ආයතනයේ කැමැත්ත මත සම්පූර්ණ පාරිතෝෂිකය ගෙවූ බවත් ප්‍රකාශ කරයි. මේ අනුව පැහැදිලි වන්නේ දීර්ඝ කාලයක් තිස්සේ පාරිතෝෂිකය ගෙවූ ක්‍රමවේදය ආයතනයේ කැමැත්ත හා ආයතනයේ තීරණය මත වෙනස් කොට ඇති බවයි.

දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන පැමිණි ක්‍රමවේදයක් එක් පාර්ශ්වයක් විසින් තම කැමැත්ත හා තීරණය මත බණ්ඩනය කිරීම යුක්ති සහගත කිරීම සඳහා තරම් ප්‍රමාණවත් සාක්ෂි දෙවන පාර්ශ්වයෙන් ඉදිරිපත් වූයේ නැත.

ඉල්ලුම්කරුගේ සාක්ෂියේ, 21 පිටුව

ප්‍ර. තමා දැනගෙන සිටියාද බේරුම්කරණයෙන් තමන්ලා සමඟ එකට වැඩ කළ කණ්ඩායමකට එසේ ගෙවන්න කියලා තීරණයක් දුන්නා කියලා? (පිටුව 21 ඡේද අංක 01)

පි. ඔව්.පිටුව 21 (ඡේද අංක 02)

ප්‍ර. ඒ තීරණය අනුව ඒ අයට සල්ලි ලැබුණද? පිටුව 21 ඡේද අංක 03

පි. මම දන්න හැටියට ඒ තීරණය අනුව ආයතනයෙන් ගෙවාගෙන යනවා. (පිටුව 21 ඡේද අංක 4)

දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදීමට පැමිණි ගණකාධිකාරි වික්‍රමනායකලාගේ කණිෂ්ක රේහාන් වික්‍රමනායක 2024.12.02 දින ලබාදෙන ලද සාක්ෂියේදී ඉහත ඉල්ලුම්කරුගේ සාක්ෂිය සනාථ වී ඇත. පිටුව 65/64

ප්‍ර. තමන්ලාගේ උපාලි නිවුස් පේපර්ස් ආයතනයේ වෙළෙඳ පාරිතෝෂිකය ඉල්ලා නඩුවක් පවරා තිබෙනවාද ? පිටුව 65 අවසාන ඡේදය

පි. ඔව් පිටුව 64 (1 වන ඡේදය)

ප්‍ර. එම නඩුවෙන් ඉල්ලා සිටියේ මෙම ඉල්ලුම්කරු ඉල්ලා සිටි ආකාරයට අවුරුද්දට මාසය බැගින් ගණන් බලන ලද පාරිතෝෂික මුදලක්ද? පිටුව 64 ඡේදය 02

පි. ඔව් පිටුව 64 (03 වන ඡේදය)

ප්‍ර. ඒ සම්බන්ධයෙන් උසාවියේ නියෝගයක් ලැබුණා කියලා දන්නවාද? පිටුව 64 (04 වන ඡේදය)

පි. ඔව්

තම අවසන් ලිඛිත සැලකිරීම් වලදී පළමු පාර්ශ්වය විසින් පිටු අංක 143 ඇමුණුම A සහ පිටු අංක 137 ඇමුණුම B ලෙස බේරුම්කරණ තීන්දුවට අදාළ ගැසට් නිවේදනය හා මෙම බේරුම්කරණ ප්‍රදානය සම්බන්ධව අභියාචනාධිකරණ තීන්දුව අමුණා ලකුණු කර ඉදිරිපත් කර ඇත.

දෙවන පාර්ශ්වය තම සාක්ෂි මගින් ප්‍රකාශ කරන ලද්දේ පාරිතෝෂික දීමනාවට අමතරව Ex Gratia (එක්ස්ගාටියා) හැටියට දීමනාවක් ලබා දුන් බවයි. එසේම ප්‍රකාශ කරන් එක්ස්ගාටියා හැටියට මුදලක් ගෙවූ බවට පිළිගත හැකි කිසිදු සාක්ෂියක් දෙවන පාර්ශ්වය ඉදිරිපත් කළේ නැත.

එසේම දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදීමට ඉදිරිපත් වූ ගණකාධිකාරි රෙහාන් වික්‍රමනායක මහතා ප්‍රකාශ කරන්නේ තමා 2014 සිට සේවය කරන බවත්, 2010 දී මිලියන 87 ක් වූ ලාභය 2011 සිට 2015 දක්වා අලාභය මිලියන 37, මිලියන 64, මිලියන 118, මිලියන 117 හා 2015 දී මිලියන 60 වූ බවත් 2016 දී අලාභය මිලියන 02 දක්වා අඩු වූ බවත්. ඉන්පසු යලි අලාභය 2017 දී මිලියන 97, 2018 දී මිලියන 145, 2019 දී මිලියන 197, 2020 මිලියන 115 හා 2021 දී මිලියන 141 ක් ලෙස අලාභ වූ බවයි. ගණකාධිකාරි ප්‍රකාශ කරන්නේ 2016 දී මිලියන 02 දක්වා අලාභය අඩු වූයේ වෙන් කරන ලද පාරිතෝෂිකය නැවත ලාභයක් ලෙස මාරුකර මාසයක් පාරිතෝෂික මුදල ලබානොදීමට ගත් තීරණය නිසා බවයි.

ගණකාධිකාරි එසේ ප්‍රකාශ කරන් 2016 දී මිලියන 02ක වූ අලාභය, 2017 සිට නැවත 2011 සිට 2015 දක්වා වූ තත්වයටම වර්ධනය වී ඇත. මේ අනුව පැහැදිලි වන්නේ පාරිතෝෂිකය සඳහා මුදල් වෙන් කිරීම පමණක් හේතුකොටගෙන ආයතනයේ අලාභයක් සිදුවී නොමැති බවයි. ගණකාධිකාරිගේ සාක්ෂියේ 65 පිටුව අවසාන ඡේද 02 මගින් මෙය තහවුරු වේ.

පාරිතෝෂිකය ගෙවීම 50% කින් අඩු කිරීම හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් මගින් මෙම සිදුවන අලාභය අඩු කර ගැනීම සඳහා කටයුතු කළ බවත් දෙවන පාර්ශ්වයේ සාක්ෂි මගින් හෙළි නොවීය. ඒ අනුව විවිධ හේතු මත සිදුවන අලාභයන් පියවීම සඳහා දීර්ඝ කාලයක් තිස්සේ අනුගමනය කළ පාරිතෝෂික ගෙවීම් ක්‍රමය මග හැරීම සඳහා වන යුක්තිසහගත කිසිදු සාක්ෂියක් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් නොවීය.

පළමු පාර්ශ්වය ප්‍රකාශ කරන්නේ තමාට වඩා වැඩි පාරිතෝෂිකයක් සඳහා, එනම් පාරිතෝෂික පනතේ 10 (01) වගන්තිය යටතේ වූ වැඩි වාසිදායක පාරිතෝෂිකයක් සඳහා හිමිකමක් ඇති බවයි. තම සමකාලීන හා තමාට පෙර පාරිතෝෂික ලබාගත් අයට එසේ වැඩි පාරිතෝෂිකයක් ගෙවා ඇති බවත් තමා සේවය ආරම්භ කරන දිනයට පෙර පටන්ම පැවතගෙන ආ ආකාරයට තමන්ට ද පාරිතෝෂික ඇතුළු අනිකුත් දීමනාවක් ලැබේ යැයි බලාපොරොත්තුවක්, විශ්වාසයක් තමා තුළ තිබූ බවත් දෙවන පාර්ශ්වකරු හා තමා අතර ලිඛිත නොවූ දීර්ඝකාලීන ව්‍යංග ගිවිසුමක් තිබූ බවත් එවැන්නක් තමන්ට වඩා වැඩි පාරිතෝෂිකයක් ලබා ගැනීමේ නීත්‍යානුකූල අයිතියක් ඇති බවයි.

දෙවැනි පාර්ශ්වය ප්‍රකාශ කරන්නේ නීතිමය යුතුකමක් නොමැති Ex Gratia එනම් ත්‍යාගයක් ලෙස කම්කරුවෙකු අන්තිමට ලබා ගත් මාසික වැටුපෙන් භාගයක් එම කම්කරුවා සේවය කළ අවුරුදු ගණනින් වැඩි කර ගෙවූ බවත්, එම ගෙවීම කරන ලද්දේ පාරිතෝෂික පනතේ 10 (01) වගන්තියට අනුව නොවන බවත් දෙපාර්ශ්වය අතර කිසිදු ගිවිසුමක් නොමැති බවත් එම නිසා පැමිණිලිකරුට වඩා වැඩි පාරිතෝෂිකයක් ලබා ගැනීමේ නීතිමය අයිතියක් නොමැති බවයි.

දෙවන පාර්ශ්වය එසේ ප්‍රකාශ කලත් නඩු විභාගයේදී ඉදිරිපත් කරන ලද වාචික හා ලිඛිත සාක්ෂි සැලකිරීමේදී දීර්ඝ කාලයක් තිස්සේ අනුගමනය කොට ඇති මෙම වැඩි වාසිදායක පාරිතෝෂිකයක් ගෙවීම් ක්‍රමය නිසා දෙපාර්ශ්වය ව්‍යංග ගිවිසුමකින් බැඳී සිටි අතර එම ගිවිසුම ප්‍රතික්ෂේප කිරීමට තරම් සාක්ෂි නඩු විභාගයේදී ඉදිරිපත් නොවීය.

පාරිතෝෂික පනතේ 10(1) වගන්තිය යටතේ පළමු පාර්ශ්වකරු සහන පතයි.

“ කම්කරුවෙකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සාමුහික ගිවිසුමකින් කාර්මික ආරාවුල් පනත යටතේ වූ කාර්මික අධිකරණයකින් හෝ බේරුම්කරුවෙකුගේ ප්‍රදානයකින් හෝ වෙනත් යම් ගිවිසුමකින් පාලනය වන අවස්ථාවක ඔවුන්ගේ සේවාවන් සම්බන්ධයෙන් ඒ පාරිතෝෂිකය ආගණනය කිරිම ඒ සාමුහික ගිවිසුමේ කාර්මික අධිකරණයේ හෝ බේරුම්කරුගේ ප්‍රදානයේ හෝ වෙනත් ගිවිසුමක දක්වා ඇති පාරිතෝෂිකය හෝ ආන්තික ප්‍රතිලාභ මේ පනත යටතේ ගෙවිය යුතු පාරිතෝෂිකයට වඩා කම්කරුවාට වාසිදායක වන්නේ නම් අවස්ථානෝචිත පරිදි ඒ සාමුහික ගිවිසුමේ කාර්මික අධිකරණයේ හෝ බේරුම්කරුගේ ප්‍රදානයේ හෝ වෙනත් ගිවිසුමේ නියමයන්ට අනුකූලව කරනු ලැබිය යුතුය ’’ යන්න පාරිතෝෂික පනතේ 10 (1) හි සඳහන් වේ.

මේ අනුව නඩු විභාගයේ සියලු කරුණු සලකා බලා පාරිතෝෂික පනතේ 10 (1) වගන්තිය අනුව පාරිතෝෂික නොගෙවීමෙන් පළමු පාර්ශ්වයට අසාධාරණයක් සිදු වී ඇති බවට නිගමනය කරමි.

මෙම අසාධාරණය නිසා හිමිවිය යුතු සහනය කුමක්ද යන්න ද සලකා බැලිය යුතු වේ.

පළමු පාර්ශ්වකරුගේ, P1 ලෙස නම් කරන ලද සේවා කාලය සඳහන් සේවා සහතිකය. P2 ලෙස සඳහන් වැටුප් විස්තරයේ පාරිතෝෂික ගණනය සඳහා වන වැටුප සම්බන්ධව හෝ මේ වන විට ගෙවා ඇති පාරිතෝෂිකය දෙපාර්ශ්වයම පිළිගනී.

ඒ අනුව ප්‍රමාද කාලයක් ද සලකා බලා 1992 අංක 62 දරන සංශෝධිත පාරිතෝෂික පනත අනුව 30% අධිභාරයක් සමගින් රුපියල් 591,630.00 (රුපියල් පන්ලක්ෂ අනූ එක්දහස් හයසිය තිහක්) මුදලක් ප්‍රදානය කරමි.

| *පැමිණිලිකරුගේ නම* | *ලැබිය යුතු සම්පූර්ණ පාරිතෝෂිතය රු.* | *දැනටමත් ගෙවා ඇති මුදල රු.* | *ගෙවිය යුතු හිඟ පාරිතෝෂිතය රු.* | *30% අධිභාරය රු.* | *ලැබිය යුතු මුළු මුදල රු.* |
|---|---|---|---|---|---|
| P.A. බෝගොඩ | 910,200.00 | 455,100.00 | 455,100.00 | 136,530.00 | 591,630.00 |

ඉහත සඳහන් මුදල මෙම ප්‍රදානය *ගැසට්* ගත වූ පසු මාස 02 ක් ඇතුළත උතුරු කොළඹ කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට දෙවන පාර්ශ්වයට මින් නියෝග කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත ප්‍රදානයක් බවට ප්‍රකාශ කරමි.

W.W. පුංචිහේවා,
බේරුම්කරු.

2025 මාර්තු මස 10 වැනි දින.

EOG 07-0358

මගේ අංකය: IR/COM/03/2022/23.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.11.18 දිනැති හා අංක 2411/03 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.11.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වැලිකන්ද, මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය ලිපිනයෙහි පදිංචි ඩබ්.එම්. අශෝකා දමයන්ති කුමාරි මිය පරිපාලන නිලධාරි (රා.ආ.) සහ කොළඹ 10, ටී.බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/62/2024 හා 2025.03.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්.එම්.ඩී.එන්.කේ.වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අප්‍රේල් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.**

**බේරුම්කරු - නීතිඥ සී.ඒ.එච්.එම්. විජේරත්න**

නඩු අංකය : A/62/2024
මගේ අංකය : IR/COM/03/2022/23

ඩබ්. එම්. අශෝකා දමයන්ති කුමාරි මිය,
පරිපාලන නිලධාරී (රා.ආ),
මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය,
වැලිකන්ද.

*පළමු පාර්ශ්වය*

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500,
ටී.බී.ජයා මාවත,
කොළඹ 10.

*දෙවන පාර්ශ්වය*

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය මැතිණිය විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඇය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වී ඇත්තේ :

''ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන නිලධාරි (රා.ආ) ලෙස සේවය කරන ඩබ්.එම්. අශෝකා දමයන්ති කුමාරි මිය හට,

- 2020.11.26 දින පැවති පරිපාලන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය අනුව පරිපාලන නිලධාරි තනතුර සඳහා තේරීම් ලේඛනයේ නියමිත සුදුසුකම් සපුරා තිබුණේද යන්නත්,

- එදින පැවැති සම්මුඛ පරීක්ෂණය මත නියමිත තනතුර ලබා නොදී නැවත වසරකට පසුව පැවැති සම්මුඛ පරීක්ෂණයේදී ඇයට අසාධාරණයක් සිදුවී තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඇයට හිමි විය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ.

මෙම බේරුම්කරණය වර්ෂ 2024.12.05 වන දින ආරම්භ කරන ලද අතර, පළමු පාර්ශ්වය වෙනුවෙන් පළමු ලිඛිත ප්‍රකාශය ඉදිරිපත් කරන ලදී. දෙවන පාර්ශ්වයේ ප්‍රකාශය 2025.01.10 වැනි දිනට ප්‍රථමව ලබාදිය යුතු බවට තීරණය වූ අතර දෙවන සැසිය 2025.01.21 වෙනි දින පවත්වන ලදී. වර්ෂ 2025.01.10 දින දෙවන පාර්ශ්වයේ පිළිතුරු ප්‍රකාශය ඉදිරිපත් කරන ලද අතර ඊට ප්‍රතිපිළිතුරු පළමු පාර්ශ්වය විසින් 2025 01.21 වැනි දින දෙවන සැසිය පවත්වන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලදී. ඊට පිළිතුරු දෙවන පාර්ශ්වය විසින් 2025 පෙබරවාරි මස 21 වැනි දින ගොනු කරන ලද අතර, ඊට පිළිතුරු සැපයීමට පළමු පාර්ශ්වයට අවශ්‍ය බව දන්වා සිටි බැවින් එම ප්‍රකාශය 2025.02.27 වැනි දාතමින් යුතුව 2025 මාර්තු 3 වෙනි දින බේරුම්කරණ අංශය වෙත භාර දෙන ලදී.

පළමු පාර්ශ්වයේ ලිඛිත ප්‍රකාශ වලින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කරන ලදී.

1. 2020.11.26 හා 27 වැනි දින පැවති සම්මුඛ පරීක්ෂණය තාවකාලිකව අත්හිට වූ බව දැන් වුවද, එම ලේඛනයේ හයවන ස්ථානයේ සිටි නිලධාරී මහතෙකුට 2020.12.10 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිපාලන නිලධාරී ii තනතුරේ පත්වීම ලබා දී විශ්‍රාම ගැන්වීමට කටයුතු සිදු කිරීම,

2. පසුව 2021.12.29 හා 30 දිනයන්හීදී නැවත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූ බවත්, එම පරීක්ෂණයේදී පරීක්ෂණ මණ්ඩලය විසින් අයථා ආකාරයට පළමු පාර්ශ්වයට හැර වෙනත් අපේක්ෂකයන්ට ලකුණු ලබා දී ඇති බව.

3. එබැවින් 2016 වසරේ සිට එම තනතුර ලබාදීමට කටයුතු කරන ලෙසද බේරුම්කරණාධිකාරයෙන් පළමුවෙනි පාර්ශ්වය ඉල්ලා සිටි.

පිළිතුරු ලෙස දෙවන පාර්ශ්වය සිය ලිඛිත දේශනයෙන් ප්‍රකාශ කර සිටියේ 2020.11.26 හා 27 වැනි දෙදින තුළ පැවැත්වූ සම්මුඛ පරීක්ණයේ ඇතිවූ ගැටලුකාරී තත්ත්වයන් මත එකී ගැටළු සම්බන්ධයෙන් තීරණයක් ගන්නා තෙක් පවත්වනු ලැබූ සම්මුඛ පරීක්ෂණ වලින් සුදුසුකම් ලැබූ නිලධාරීන් හට පත්වීම් ලබාදීමට කටයුතු නොකළ බවයි.

දෙවන පාර්ශ්වය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේ,

i 2020.09.25 වෙනි දිනට අයදුම්පත් කැඳවීමේදී පැවැති පුරප්පාඩු එකොළහ සඳහා නැවත බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය 2021.12.29 සහ 30 යන දෙදින තුළ පැවැත්වූ බවත්,

ii. එකී සම්මුඛ පරීක්ෂණයේදී ඉල්ලුම්කාරිය ලකුණු ලබා ගන්නා ලද අනුපිළිවෙල මත 24 වන ස්ථානයේ පසුවන බැවින් සහ පුරප්පාඩු 11ක් පමණක් පැවතීම හේතුකොට ගෙන පරිපාලන නිලධාරී ii ශ්‍රේණිය, JM i-i සේවා ගණයෙහි තනතුර සඳහා තේරී පත්වී නොමැති බවයි.

iii. එවකට පැවති පුරප්පාඩු සහ කුසලතා අනුපිළිවෙල මත වාස්තවික උපමාණයන් මත පමණක් සුදුස්සන් තෝරාගත් බවය.

වර්ෂ 2025.01.21 වෙනි දින පැවැති බේරුම් කරන සැසියේ දී පළමු පාර්ශ්වය ගොඩනගන ලද තර්කය වූයේ 2020 වර්ෂයේ පැවති සම්මුඛ පරීක්ෂණය අවලංගු කරන ලද බව නාමිකව ප්‍රකාශ කරන ලද නමුත් නැවත 2021 වර්ෂයේ දී සම්මුඛ පරීක්ෂණයක් කැඳවන ලද බවත්, 2020 වර්ෂයේ පැවති සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැයිස්තුවට ඉතා සුළු වෙනස්කම් සහිතව එයම ක්‍රියාත්මක කරන ලද බවයි.
2020 .11.26 සහ 27 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත හයවන ස්ථානයේ සිටි සරත් අමරසිංහ නමැති අයට පරිපාලන නිලධාරි තනතුරක් ප්‍රදානය කරන ලද නිසා 2020.11.26 සහ 27 දින පැවති සම්මුඛ පරීක්ෂණය අවලංගු කරන ලද බවට කරන ප්‍රකාශය පිළිගත නොහැකි බවයි.

ඊට පිළිතුරු ලෙස දෙවන පාර්ශ්වය විසින් 2021.12.29 සහ 30 යන දිනයන්හි පැවති සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලැයිස්තුව බේරුම්කරණයට ඉදිරිපත් කරන ලදී.

තවද, අවස්ථානුගත තත්ත්වයන් යටතේ 2020.11.26 හා 27 යන දිනයන්හි පැවති සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් යොමු කර තිබූ අභියාචනා පිළිබඳ තීරණ ගැනීමට අභියාචනා මණ්ඩලයකට යොමු කරන ලද බවත් එකී තීරණ ලබාදීමට පෙර 2020.12.12 වෙනි දින විශ්‍රාම ගැන්වීමට නියමිතව සිටි ජේ. ඒ. සරත් අමරසිංහ මහතා යන අයට පරිපාලන නිලධාරි ii ශ්‍රේණිය JM 1-i සේවා ගණයෙහි තනතුරක් සඳහා පත්වීමක් පිරිනමන ලද බවත් දෙවන පාර්ශව අධිකාරිය විසින් 2020.11.26 සහ 27 වෙනි දෙදින තුළ පැවති සම්මුඛ පරීක්ෂණය නැවත පැවැත්වීමට තීරණය කරන ලද බවත් එකී තීරණයත් සමඟ පත්වීමක් පිරිනමන ලද ජී.ඒ. සරත් අමරසිංහ මහතා යන අයට ලබාදුන් පත්වීම ලිපියද අවලංගු කරන ලද බවයි.

පළමු පාර්ශ්වය 2025.02.28 වැනි දිනැති ප්‍රති උත්තරයෙන් ප්‍රකාශ කර සිටින්නේ බේරුම්කරණයේදී දෙවැනි පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද R5 ලෙස සඳහන් කර ඇති 2021.12.29 සහ 30 දින සම්මුඛ පරීක්ෂණ ප්‍රතිපල ලේඛනය ව්‍යාජව සකස් කරන ලද ලියවිල්ලක් බවයි.

මෙම බේරුම්කරණ විවෘත අධිකරණයේදී 2025.01.21 වෙනි දින කැඳවූ අවස්ථාවේ ඉල්ලුම්කාරිය විසින් 2020 .11.26 සහ 27 වෙනි දින පවත්වන ලද නමුත් පසුව අත්හිටුවන ලද සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අයට එකී තනතුරු ලබාදීමට නියෝගයක් සහ පසුව 2021.12.29 සහ 30 යන දෙදින තුළ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල අවලංගු කරන ලෙසට නියෝගයක් ඉල්ලා සිටින ලදී.

විසඳිය යුතු ප්‍රශ්න, නිරීක්ෂණ සහ නියෝගය

i. පළමු පාර්ශ්වය 2024.11.25 වෙනි දින ලිඛිත ප්‍රකාශයෙන් අයැද සිටින 2016 වසරේ සිට මෙම තනතුර ලබාදීමට නියෝගයක් කළ හැකිද?

<u>නිරීක්ෂණය</u>

මෙම ඉල්ලීම මෙම බේරුම්කරණාධිකාරයට ලබාදී ඇති ප්‍රස්තුත කාරණාව හා පටහැනි බැවින් එවැනි නියෝගයක් ලබාදීමට මෙම අධිකාරියට බලයක් නොමැත.

ii. 2020/11/ 26 හා 27 දිනයන්හි පැවැත් වූ සම්මුඛ පරීක්ෂණය අවලංගු කිරීමට පාලන අධිකාරියට බලයක් තිබෙන්නේද?

<u>නිරීක්ෂණය</u>

සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට පාලන අධිකාරියක් විසින් තීරණය කරනු ලබන්නේ යම් යම් නිලධාරීන්ගේ සම්මුඛ පරීක්ෂණයක් මගින් උචිතානුචිත භාවය පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කිරීමටයි. එම නිර්දේශ පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට පාලනාධිකාරියට හැකියාවක් ඇත. එම සම්මුඛ පරීක්ෂණය තාවකාලිකව නතර කිරීමට සිදුවූ කරුණු දෙවන පාර්ශ්වය ප්‍රමාණවත් සාක්ෂි මගින් ඉදිරිපත් කරන ලදී. එබැවින් මෙම සම්මුඛ පරීක්ෂණය නවතා දැමීමට තීරණය කිරීම නීත්‍යානුකූලව සිදුකර ඇත.

iii. එසේ නම් 2020 12.12. වැනි දින විශ්‍රාම ගැන්වීමට නියමිතව සිටි ජී. ඒ සරත් අමරසිංහ මහතාට පරිපාලන නිලධාරි ii ශ්‍රේණිය JM 1-i සේවා ගණයෙහි තනතුරක් පිරිනැමීම සිදුවූයේ කෙසේද?

<u>නිරීක්ෂණය</u>

වසර ගණනාවක සේවා කාලයකින් පසුව විශ්‍රාම ගැනීමට ආසන්නව සිටින නිලධාරියකු සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පාලනාධිකාරියට හැකියාවක් පවතී. එම පත්වීම නීත්‍යානුකූල නොවන බවට පැවසිය නොහැකියි. එම පත්කිරීම සිදුකරන ලද්දේ ඔහුගේ විශ්‍රාම ගැන්වීම ඉතා අසන්නව තිබීම සහ සම්මුඛ පරීක්ෂණයක් නැවත පැවැත්වීමට ගන්නා ලද තීරණයට පෙර බව දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටී. කෙසේ වෙතත් නැවත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට අධිකාරිය තීරණය කිරීමත් සමඟ සරත් අමරසිංහ මහතාට ලබා දුන් පත්වීමද අවලංගු කරන ලද බව දෙවන පාර්ශ්වය ප්‍රකාශ කරයි. එවැනි පත්වීමක් ලබා දුන්නද පළමු සාර්ශවයට ඒ මත පත්වීමක් ලබාදිය යුතු යැයි කරන තර්කය පිළිගත නොහැකියි.

iv. 2020.11.26, 27 පැවැත් වූ සම්මුඛ පරීක්ෂණය වෙනුවට 2021.12.29, 30 දිනයන්හි පැවැත් වූ සම්මුඛ පරීක්ෂණයට විශ්‍රාම ගොස් සිටි නිලධාරින් කැඳවිය හැකිද?

<u>නිරීක්ෂණය</u>

යම් යම් පරිපාලනමය දෝෂයන් හෝ වෙනත් නොවැලැක්විය හැකි හේතූන් මත නමුත් අදාල නිලධාරියාගේ පාලනයෙන් බැහැර වූ කරුණු මත තම සේවා කාලය තුළදී ලැබිය යුතු උසස් වීම් නොලැබීම හේතු කොටගෙන යම් නිලධාරියෙකුට අසාධාරණයක් සිදුවී ඇත්නම් එවැනි නිලධාරීන් හට තමාට සේවා කාලය තුළ ලැබිය යුතුව තිබූ උසස් වීම් මත විශ්‍රාම වැටුප් ලබාදීමට කටයුතු කිරීම

සඳහා එවැනි නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පාලන අධිකාරියට බලය තිබෙන අතර, එවැනි නිලධාරීන් සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කිරීම යුක්ති සහගතයි.

V. දෙවන පාර්ශ්වය විසින් බේරුම්කාර අධිකාරියට ව්‍යාජ සහ කූට ලේඛන ඉදිරිපත් කර තිබෙන්නේද?

<u>නිරීක්ෂණය</u>

මෙම බේරුම්කරණාධිකාරිය විසින් අදාළ ප්‍රස්තුත කාරණය සම්බන්ධයෙන් කරුණු විමසා බලන්නේ අදාළ පාර්ශ්වයන් විසින් ආයතනමය වශයෙන් සහ පෞද්ගලිකව නිවැරදි තොරතුරු හා ලේඛන ඉදිරිපත් කරන්නේය යන සම්පූර්ණ විශ්වාසය පදනම් කරගෙනයි.

යම්කිසි පාර්ශ්වයක් ඊට පටහැනිව කටයුතු කරන බවට කරුණු දක්වන්නේ නම් කූට ලේඛන සැකසීම හා තොරතුරු වසන් කිරීම යන කරුණු මත අධිකරණමය ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකිය. ඒ සඳහා ප්‍රබල සාක්ෂි ලෙස මෙම බේරුකරණාධිකරණයට ඉදිරිපත් කරන ලද ලියකියවිලි එවැනි අධිකරණමය කටයුත්තක දී සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමට හැකියාව ලැබේ.

vi. පළමු පාර්ශ්වය විසින් අයැද සිටින 2020.11.26 සහ 27 දිනයන්වල පවත්වන ලද නමුත් පසුව අත්හිටුවන ලද සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අයට එකී තනතුරු ලබාදීමට නියෝගයක් සහ පසුව 2021.12. 29 හා 30 යන දිනයන්හි පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය ප්‍රතිඵල අවලංගු කරන ලෙසට නියෝගයක් ලබාදීමට මෙම අධිකාරියට හැකිද?

<u>නිරීක්ෂණය</u>

එවැනි අධිකාරි බලයක් මෙම බේරුම්කරණ අධිකාරියට නොමැත.

නියෝගය/ප්‍රදානය

ඉහත කී කරුණු අනුව මෙම බේරුම්කරණ අධිකාරියට පමුණන ලද කාර්මික ආරවුලට හේතු වූ කරුණු සනාථ කිරීමට පළවෙනි පාර්ශ්වය විසින් සමත් වූයේ නැත. ඒ අනුව අයදුම්කාරියගේ අයදුම් පත්‍රය නිෂ්ප්‍රභා කරන බවට තීන්දු කරමි.

එමෙන්ම මෙම තීන්දුව ඉදිරිපත් වූ කරුණු අනුව සාධාරණ හා යුක්ති සහගත තීන්දුවක් බවටත් මම සහතික කරමි.

**නීතිඥ සී.ඒ.එච්.එම්. විජේරත්න**.

වර්ෂ 2025 මාර්තු මස 18 වැනි දින.

E0G 07 - 0359

---

මගේ අංකය: IR/COM/03/2020/111.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.08.27 දිනැති හා අංක 2399/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.07.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බිබිල, ඇකිරියන්කුඹුර, අරළුපිටිය ලිපිනයෙහි පදිංචි ඩී. එම්. දිසානායක මහතා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/43/2024 හා 2025.04.09 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 අප්‍රේල් මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව - කොළඹ

ඩී. එම්. දිසානායක මහතා,
අරළු පිටිය,
ඇකිරියන් කුඹුර,
බිබිල.

*පළමු පාර්ශ්වය*

*නඩු අංකය* : A/43/2024
*මගේ අංකය* :IR/COM/03/2020/111

*- එදිරිව -*

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

**බේරුම්කරණ ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත දෙපාර්ශ්වය අතර ඇති ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩමාදුව, ද විලේජ්, හි අංක 202/B/61 හි පදිංචි නීතිඥ විජේසූරිය ආරච්චිලාගේ ජයවික්‍රම වන මා පත් කරනු ලැබ ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුල වශයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුගේ අංක IR/COM/3/2020/111 හා 2024.07.23 වන දින මා වෙත දන්වා ඇත්තේ " ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ රියදුරු ලෙස සේවය කරන ඩී. එම් දිසානායක මහතාගේ සේවය අත්හිටුවා ඔහුට විරුද්ධව සිදුකල විනය පරීක්ෂණයෙන් අනතුරුව 2016.06.23 වන දිනැති විනය නියෝගයෙන් මාසයක කාලයකට සේවය තාවකාලිකව අත්හිටුවීම දඬුවමක් ලෙස දී තිබියදී එම විනය නියෝගය ප්‍රමාද වී ලැබීම නිසා ඩී.එම්. දිසානායක මහතාට මාස 6 කට අධික කාලයක් සේවයට වාර්තා කිරීමට නොදීම මඟින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේද? යන්න සහ එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව " බේරුම්කරුවෙකු වශයෙන් අදාළ විභාගය පවත්වා සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් ලබාදෙන ලෙසයි.

ඒ අනුව මා විසින් 2024.09.13, 2024.10.08, 2024.11.07. 2024.12.18 හා 2025.01.23 යන දිනවල බේරුම්කරණය සඳහා දෙපාර්ශ්වය බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවට කැඳවනු ලැබීය. ප්‍රථමයෙන් දෙපාර්ශ්වය අතර සමථයක් මඟින් මෙම ආරාවුල නිරවුල් කිරීමට උත්සහ කල නමුත් එය අසාර්ථක වූ හෙයින් දෙපාර්ශ්වයට ම ලේඛන ගොනු කිරීමට අවස්ථාව ලබාදී අවසන් ලිඛිත දේශන 2025.03.14 වන දින පස්වරු 4.00 ට පෙර ගොනු කළ යුතු බවට නියම කරනු ලැබීය.

බේරුම්කරු වශයෙන් මා මෙම කාර්මික ආරාවුල විභාගය ආරම්භ කල ප්‍රථම දිනයේදී පළමු වන පාර්ශ්වකරු වන ඩී.එම්. දිසානායක මහතාට දන්වා සිටියේ මෙම කාර්මික ආරාවුලට අදාළ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබාදී ඇති 2024.07.23 දිනැති යොමුව නිවැරදිද? යන්නයි. එය නිවැරදි බව ඔහු පිළිගත් අතර මා දෙපාර්ශ්වයටම දන්වා සිටියේ මෙම ආරාවුල අවම වශයෙන් මාස 3ක් තුළ නිම කළ යුතු බවත් දෙපාර්ශ්වයේ එකඟතාවය මත ආරාවුල සමථ කිරීමට උත්සහ දරන බවත්, විධිමත් අධිකරණයකදී මෙන් සාක්ෂි විභාගයක් හෝ ලේඛන ගොනු කිරීමක් සිදු නොවුනද දෙපාර්ශ්වයටම සාධාරණයක් ඉටුවන ආකාරයට ඔවුන්ගේ වාචික ප්‍රකාශ හා ලේඛන ගොනු කිරීමට අවස්ථාව ලබාදෙන බවත් පැහැදිලි කර සිටින ලදී. අනතුරුව මෙම ආරාවුල සම්බන්ධව වෙනත් අධිකරණයක නඩුවක් පවතින්නේද? යන්න විමසූ අතර එවැන්නක් නොවීම හේතුවෙන් මෙම කාර්මික ආරාවුල බේරුම්කරණ ක්‍රියාවලිය මඟින් බේරුම් කිරීම සඳහා පියවර ගන්නා බව පළමුවන පාර්ශ්වකරුට හා ඔහුගේ නියෝජිතටත් දෙවන පාර්ශ්වකරු වන ලංකා ගමනා ගමන මණ්ඩලයට පැහැදිලි කර දෙනු ලැබීය.

මෙම ආරාවුල ප්‍රථමයෙන් මොණරාගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේදී ද පසුව කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශයේදී විභාග කරනු ලදුව නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (කාර්මික සබඳතා ) ගේ අංක IR/COM/3/2020/111 හා 2023.11.04 දිනැති ලිපියෙන් දෙවන පාර්ශ්වකාර ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත දන්වා ඇත්තේ විනය නියෝගය ප්‍රමාද වීම හේතුවෙන් මාස 6 කට අධික කාලයක් පළමු වන පාර්ශ්වකරු වැඩ තහනම්ව තිබීම හේතුවෙන් එම වැඩිපුර වැඩ තහනම්ව සිටි කාලයට අදාළ වැටුප් ලබාදීම නිර්දේශ කරන බවත් ඒ අනුව ඒ වැටුප් ගෙවීමට කටයුතු කරන ලෙසත්ය. නමුත් ඒ සම්බන්ධව දෙවන පාර්ශ්වයේ නිසි සැලකිල්ලක් නොවීම හේතුවෙන් එය බේරුම්කරණයට යොමු වී තිබේ.

පළමුවන පාර්ශ්වකරු 2024.09.13 වැනි දින සිය මූලික ප්‍රකාශය ගොනු කරමින් කියා සිටින්නේ, තමා 1988 දී බිබිල ඩිපෝවේ බස් රියදුරෙකු වශයෙන් සේවයට බැඳුනු අතර 2019.03.21 වන දින නියමිත වයස් සීමාව සම්පූර්ණ කිරීම හේතුවෙන් විශ්‍රාම ගත් බවයි. 2016.02.01 වැනි දින සිට තමාගේ රාජකාරි වැඩ තහනම් කළ අතර ඊට අදාළ අභියාචනා ඉදිරිපත් කළමුත් නිසි සහනයක් නොලැබීම හේතුවෙන් පළමු වන පාර්ශ්වකරු වන තමා මොණරාගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලට පැමිණිලි කරන ලදුව ඒ පිළිබඳව වූ පරීක්ෂණය අතරමග දෙවන පාර්ශ්වය විසින් තමා 2017.02.09 වැනි දින යළි සේවයට වාර්තා කිරීමට අවස්ථාවක් ලබාදුන් බවත් ඒ සිදු වූයේ කම්කරු දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම හේතුවෙන් බවත් කියා සිටී. තමාගේ විනය පරීක්ෂණය අවසානයේ අංක ශ්‍රී ලංගම/මාසක/විනය/ඌව/45/2016 හා 2016.06.23 දිනැති විනය නියෝගය නිකුත් කර තිබූ අතර එම විනය නියෝගය අනුව වැඩ තහනම්ව සිටි කාලයට අදාළ වේතන අහිමි කරමින් මාස එකක කාලයකට සේවය තාවකාලිකව අත්හිටුවීමට හා මෙවැනි චෝදනාවකට ලක් නොවන ලෙසට තරයේ අවවාද කරමින් විනය නියෝගයක් නිකුත් කර ඇත. (බේරුම්කරු වශයෙන් මා හට මෙම විනය නියෝගය වටහා ගැනීමට නොහැකිය. විනය නියෝගය අනුව මාස එකක කාලයකට තාවකාලිකව සේවය අත්හිට වූ අතර වැඩ තහනම් කළ දින සිට විනය නියෝගය නිකුත් කරන තෙක් එනම් 2016.02.01 සිට 2016.06.23 දින දක්වා වුදිතට මාසික වේතන අහිමි කර තිබේ. ඒ අනුව සේවය අත්හිටවීම එක් මාසයකටද, මාස හතරයි දින විසිතුනකටද? යන්න ප්‍රශ්ණගතය.)

මෙම විනය නියෝගය තමා වෙත ලබා නොදුන් අතර එය බිබිල ඩිපෝවට ෆැක්ස් මගින් එවා ඇත්තේද 2016.10.26 වැනි දින බවත් අනතුරුව ඊටත් මාස ගණනකට පසු එනම් 2017.02.09 වැනි දින තමා නැවත සේවයේ පිහිටුවූ බවත්ය. නැවත සේවයේ පිහිටුවීමෙන් අනතුරුව තමාට එරෙහිව ලබා දුන් විනය නියෝගය සම්බන්ධව අභියාචනයක් සිදුකල බවත් එම අභියාචනය විභාග කිරීමෙන් අනතුරුව 2017.06.12 වන දින මගේ අංක ශ්‍රී ලංගම/මාසක/විනය/109/ඌව ප්‍රා/2017/14 දිනැති ලිපියෙන් අභියාචනා මණ්ඩල තීරණය ලබා දුන් බවත් එම තීරණය අනුව සේවය තහනමට ලක්ව සිටි කාලය දඩුවමට යටත් කිරීම හා තරයේ අවවාද කිරීම එලෙසම ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බව තමා වෙත දන්වා සිටි බවත් කියා සිටී. ඒ අනුව වැඩ තහනම් කළ කාලය අවුරුදු එකක් වන හෙයින් එම අභියාචනා නියෝගය ද විනය ව්‍යවස්ථා මාලාවට පටහැනි බව කියා සිටී.

මේ සම්බන්ධව දෙවන පාර්ශ්වය විසින් ගොනු කරන ලද පිළිතුරු ප්‍රකාශයෙන් සඳහන් වන්නේ සේවයෙන් විශ්‍රාම යැමෙන් පසුව මෙම නඩුව පවරා ඇති නිසා සජීවී ආරාවුලක් නොමැති හේතුව මත මුල් අවස්ථාවේදී ම මෙම නඩුව නිෂ්ප්‍රභා විය යුතු බවයි. ඊට අතිරේකව 1992.06.07 වැනි දින දෙවන පෙළ රියදුරු තනතුරට පළමු වන පාර්ශ්වකරු පත්ව ඇති අතර ඉන් පසුව 1 පෙළ දක්වා උසස් වීම් ලබාදී ඇති බවත් 2015.10.13 හා 2015.10.30 දින නිලධාරි උපදෙස් පැහැර හැරීම හේතුවෙන් විනය විභාගයක් පවත්වා තීරණයක් ගන්නා තෙක් 2016.02.01 දින සිට පළමු පාර්ශ්වකරුගේ වැඩ තහනම් කළ බවත් ඊට අදාළ චෝදනා පත්‍රය 2016.02.11 වැනි දින නිකුත් කළ අතර ඊට අදාළ විනය නියෝගය 2016.06.23 වන දින ලබාදුන් බවත් ප්‍රකාශ කර සිටී. දෙවන පාර්ශ්වය 2025.03.14 දිනැති ලිඛිත දේශනවලින් දක්වා ඇත්තේ පළමුවන පාර්ශ්වකරු නැවත සේවයේ පිහිටු වීමෙන් පසු විනය නියෝගයට ඉදිරිපත් කරන ලද අභියාචනය 2017.02.20 වැනි දිනැතිව ඔහුගේ අත් අකුරින් සම්පූර්ණ කර ඇති ආකෘති පත්‍රය අනුව (R1 ලේඛනය)

එහි 8 (අ) යටතේ නියෝගය නිකුත් කල දිනය වශයෙන් 2016.06.23 වැනි දිනද, 8 (ආ) යටතේ නියෝගය ලැබූ දිනය 2016.10.26 ලෙසද සඳහන් කර ඇති නිසා සත්‍ය වශයෙන්ම 2016.10.26 දින වන විට ඔහු සිය විනය නියෝගය සම්බන්ධව දැනුවත්ව සිටි බවයි. ඒ අනුව විනය පරීක්ෂණය අවසන් වී විනය නියෝගය ලබාදීම ප්‍රමාද වී ඇත්තේ මාස 4ක පමණ කාලයක් බව කියා සිටී.

ඊට අතිරේකව අවසන් ලිඛිත ප්‍රකාශයෙන් ඉහළ අධිකරණ තීන්දු ගණනාවක් සාරාංශගත කරමින් දෙවන පාර්ශ්වය කියා සිටින්නේ, 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 19 වන වගන්තිය අනුව බේරුම්කරු විසින් ලබාදෙනු ලබන ප්‍රදානයක් සේවා යෝජකයා හා සේවකයා අතර පවතින සේවා ගිවිසුමේ කොන්දේසියක් බවට පත් වන බවත් මෙම පළමු වන පාර්ශ්වකරු විශ්‍රාම ගොස් ඇති හේතුව මත සජීවී ආරාවුලක් නොමැති බවත්ය. නමුත් මෙම සවිස්තර විරෝධතාවය ගොනු කල යුත්තේ අවසන් ලිඛිත දේශන සමඟ නොව මූලික විරෝධතාවයක් වශයෙනි. මූලික විරෝධතාවයක් වශයෙන් ගොනු කළ යුත්තක් අවසන් ලිඛිත දේශන සමඟ ඉදිරිපත් කිරීම හේතුවෙන් එම කරුණ බේරුම්කරණ ප්‍රදානයට කිසිදු බලපෑමක් නොකරන අතර එම විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි.

මෙම ප්‍රශ්ණගත කාර්මික ආරාවුල අනුව විධිමත් විනය පරීක්ෂණය හා එම විනය පරීක්ෂණයෙන් පසු නිකුත් කළ විනය නියෝගයත් ඉන්පසුව සිදු කරන ලද නැවත සේවයේ පිහිටුවීමත් අනතුරුව අභියාචනා පටිපාටියත් පදනම් විය යුත්තේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් අනුමත කර ඇති විනය ව්‍යවස්ථා මාලාවට අනුකූලවය. ඊට අතිරේකව දෙපාර්ශ්වයම පිළිගන්නා පරිදි විනය කටයුතු සම්බන්ධව 1975 අප්‍රේල් 29 වැනි දින නිකුත් කරන ලද iv වන ව්‍යවස්ථාව යටතේ පවත්වන විනය විභාග *හෙවත්* නිත්‍ය උපදෙස් ( විනය/අංක 1/1975) යන ලේඛනයත් පදනම් කරගත යුතු වේ. විශේෂයෙන් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථා මාලාවේ පහත ඡේද මෙම ප්‍රශ්ණගත කාර්මික ආරාවුල සඳහා ඍජුවම බලපාන බව පෙනේ. එහි

4.6 ඡේදය අනුව චෝදනා පත්‍රය නිකුත් කල දිනයේ සිට මාස 3 ක් ඇතුළත විනය පරීක්ෂණය පවත්වා නිම කළ යුතු වේ.

4.10 මෙම ව්‍යවස්ථාව යටතේ පවත්වනු ලබන විනය පරීක්ෂණයකදී කරනු ලබන නියෝගයක් නිසි බලධරයා විසින් තමාට විභාග නිලධාරි තැනගෙන් විනය ලිපිගොනුව ලැබී දින 14ක් ඇතුලත සේවකයාට ලිඛිතව දැනුම්දිය යුතුය......... යම් සේවකයෙකු වරදකරු බව ඔප්පු වී දඬුවම් ලැබුවහොත් චෝදනා පත්‍රයේ හා නියෝගයේ පිටපතක් අදාළ සේවකයාගේ පෞද්ගලික ලිපි ගොනුවේ ගොනු කළ යුතුය.

10 දඬුවම. 10.1 (viii) යටතේ විනය පරීක්ෂණයකින් පසු සේවකයෙකුට දඬුවමක් වශයෙන් මාස 6ක් දක්වා තාවකාලිකව සේවය අත්හිටුවීමට හැකි බව දැක් වේ. එහි (ii) යටතේ තදින් අවවාද කිරීම ද දඬුවමක් ලෙස ඇතුලත්ය.

10.2.6 තාවකාලිකව සේවය අත්හිටුවීම. මෙම දඬුවමින් සේවකයෙකුට නියම කරන ලද කාල පරිච්ඡේදයක් තුළ සේවය කිරීම තහනම් කරනු ලැබේ................ මෙම දඬුවම එක් වරකදී මාස හයකට නොවැඩි කාලයක් සඳහා නියම කළ යුතු වේ.

12.1 අභියාචනා කිරීමට සේවකයින්ට ඇති අයිතිය. මෙම විනය ව්‍යවස්ථා මාලාවට යටත්ව පැවැත් වූ විනය පරීක්ෂණයකින් පසුව දඬුවම් කරනු ලබන කිසියම් සේවකයෙකුට එම නියෝගයට විරුද්ධව අභියාචනා කිරීමට අයිතියක් තිබේ. එම නියෝගයට විරුද්ධ අභියාචනයක් දඬුවම දන්වන ලද දිනයේ සිට මසක් ඇතුලත මෙම ව්‍යවස්ථාවට අමුණා ඇති (ඊ) උපලේඛනයේ නියමකර ඇති ආකෘතිය මගින් ලිඛිතව ඉදිරිපත් කළ යුතුය යනුවෙන් දැක්වේ.

මෙම බේරුම්කරණ විභාගයේදී ඉහත විස්තර කළ ඡේද ප්‍රශ්නගත විනය පරීක්ෂණය හා විශ්ලේෂනාත්මකව ගැලපීමක් සිදු කරනු ලැබීය. ඒ අනුව විනය ව්‍යවස්ථා මාලාවේ 4.6 අනුව මාස 3 ක් තුළ අදාළ විනය පරීක්ෂණය අවසන් කළ යුතු වේ. පළමුවන පාර්ශ්වකරුට 2016.02.11 වන දින චෝදනා පත්‍රය නිකුත්කර ඇති නිසා ඊට අදාළ විනය පරීක්ෂණය එදින සිට මාස 3ක් තුළ එනම් 2016.05.11 වන දින වන විට නිම කළ යුතු වේ. අනතුරුව එදින සිට දින 14ක් තුළ විනය නියෝගය නිකුත් කළ යුතු වේ. ඒ අනුව පළමුවන පාර්ශ්වකරුට එරෙහිව විනය නියෝගය නිකුත් කළ යුතුව තිබුණේ 2016.05.25 වන දිනය. නමුත් විනය නියෝගය නිකුත්කර ඇත්තේ 2016.06.23 වන දිනය. ඒ අනුව දින 28 ක (දළ වශයෙන් එක් මාසයක) ප්‍රමාදයක් සිදුව තිබේ.

දෙවනුව විනය ව්‍යවස්ථා මාලාවේ 4.10 වගන්තිය අනුව විනය බලධරයා විසින් දින 14ක් තුළ සේවකයාට ලිඛිතව දන්වා එවීම සිදුකළ යුතුය. මේ අනුව විනය නියෝගය ලියාපදිංචි තැපැලෙන් හෝ ආයතනයේ ලිපි බාරදෙන්නෙකු මගින් හෝ අදාළ පුද්ගලයා කාර්යාලයට කැඳවා පෞද්ගලිකව හෝ බාරදීම සිදු කල හැකි වේ. විනය නියෝගය තැපැලෙන් බාරදෙනු ලබන්නේ නම් එය අනිවාර්යෙන්ම ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු වේ. ආයතනයේ තැපැල්කරුවෙකු මගින් අතින් බාරදෙනු ලබන්නේ නම් ඒ අදාළ තැපැල්කරු වෙතින් චූදිත විනය නියෝගය බාරගත් බවට ලිඛිතව සටහනක් ලබාගත යුතු වේ. ඒ හැර චූදිත කාර්යාලයට කැඳවා විනය නියෝගය බාරදෙනු ලබන්නේ නම් එම විනය නියෝගය බාරදෙන ගොනුවේ අනු පිටපතේ මුල් විනය නියෝගය බාරගත් බවට චූදිතගේ අත්සනක් තිබිය යුතු වේ. ඒ හැර වෙනත් ආකාරයකින් එනම් ආරංචි මාර්ගයෙන් හෝ දුරකථන මාර්ගයෙන් හෝ වෙනත් යම් ක්‍රමයකින් විනය නියෝගය චූදිතගේ දැන ගැනීමට ලක් කිරීම හෝ චූදිත දැනගන්නට ඇතැයි උපකල්පනය කිරීම මුළුමනින්ම පරිපාලනමය වශයෙන් වැරදි ක්‍රියාවකි. ඒ අනුව මෙම ප්‍රශ්නගත ආරාවුලේ විනය නියෝගය චූදිත වෙත ලිඛිතව බාරදුන් බවට හෝ වෙනත් ආකාරයකට බාරගත් බවට කිසිදු සටහනක් කිසිදු ලේඛනයක් දෙවන පාර්ශ්වය ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. ඔවුන් කියා සිටින එකම දෙය නම් චූදිත නැවත සේවයේ පිහිටුවීමෙන් පසු විනය නියෝගයට එරෙහිව කරන ලද අභියාචනයේ චූදිත විසින් සටහන්කර ඇති විනය නියෝගය ලැබූ දිනය වශයෙන් 2016.10.26 දින සටහන් කිරීම පමණි. නමුත් ඉදිරිපත් වූ සාක්ෂි අනුව 2016.10.26 වන දින විනය නියෝගය ෆැක්ස් මගින් ලැබී ඇත්තේ බිබිල ඩිපෝ කළමනාකරු වෙතයි. ඒ අනුව චූදිත බිබිල ඩිපෝවේදී මෙම අභියාචනා ආකෘතිය සම්පූර්ණ කොට විනය නියෝගය ලැබූ දිනය 2016.10.26 වශයෙන් සටහන්කර ඇති බව පෙනේ.

තුන්වනුව ලංකා ගමනා ගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථා මාලාවේ අංක 10 යටතේ දඬුවම් පෙළ ගස්වා ඇති අතර ඒ යටතේ දඬුවම් (i) සිට (xi) දක්වා වර්ගකොට ඇත. එහි viii යටතේ දක්වා ඇත්තේ මාස හයක් දක්වා තාවකාලික සේවය අත්හිටුවීම සිදු කරමින් දඬුවම් කළ හැකි බවයි. ඊට අතිරේකව 10.2.6 ඡේදය යටතේද එක වරකදී මාස හයකට නොවැඩි කාලයක් සඳහා තාවකාලිකව සේවය අත්හිටුවීම දඬුවමක් වශයෙන් ලබාදිය හැකි බව දක්වා ඇත.

ඒ අනුව මෙම ප්‍රශ්නගත බේරුම්කරණ විභාගයේ පළමුවන පාර්ශ්වකරු රාජකාරි වැඩ තහනම්ව සිටි කාලය 2016.02.01 දින සිට 2017.02.09 දින දක්වා වේ. එනම් රාජකාරි වැඩ තහනම්ව සිටි කාලය අවුරුදු එකකුත් දින 8ක් වේ. 2016.06.23 වන දින විනය නියෝගය නිකුත් කරන අවස්ථාව වන විට ඔහුගේ සේවය අත්හිටුවා මාස හතරකුත් දින විසි පහක් වුවද වැඩ තහනම් කළ දින සිට අවුරුද්දක් හා දින 8ක් ගතවන තෙක් ඔහු නැවත සේවයේ පිහිටුවීමක් සිදුකර නොමැත. මෙය බරපතල ලෙස විනය ව්‍යවස්ථා මාලාව උල්ලංඝනය කිරීමක් වේ. දෙවන පාර්ශ්වය විසින් මෙම ප්‍රමාදය සම්බන්ධව කිසිදු සාධාරණ හා යුක්ති සහගත කරුණක් හෝ හේතුවක්

ඉදිරිපත්කර නොමැත. ඔවුන්ගේ එකම තර්කය වන්නේ 2016.10.26 දින විනය නියෝගය පිළිබඳ ඔහු දැනුවත්ව සිටි බව විනය නියෝගයට එරෙහිව කරන ලද අභියාචන ආකෘතිය අනුව හෙළිවන හෙයින් එම කාලය ඊට වඩා අඩු විය යුතු බවයි. දෙවන පාර්ශ්වය වැඩිදුරටත් කියා සිටින්නේ. විනය නියෝගයට ප්‍රමාදවීමට එක් හේතුවක් වශයෙන් පරීක්ෂණ නිලධාරි විසින් විනය පරීක්ෂණයට චූදිත කැඳ වූ අවස්ථාවේදී ඔහුට සිය නියෝජිතයා තෝරා ගැනීමට නොහැකිවීම හේතුවෙන් එක් වරක් කල් ඉල්ලා සිටි බවයි. නමුත් මෙම ව්‍යවස්ථා මාලාව අනුව චූදිත නිලධාරියෙකුට එවැනි අවස්ථා දෙකක් ලබාදී ඇත. ඒ අනුව එම තර්කය ප්‍රතික්ෂේප කරමි. මා ඉහතින් විනය නියෝගය දැනගත් ආකාරය සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වයේ තර්කය ප්‍රතික්ෂේප කර ඇත. ඒ නිසා පළමුවන පාර්ශ්වකරුගේ වැඩ තහනම් කිරීම 2016.02.01 දින සිට 2017.02.09 දක්වාම අඛණ්ඩව අවුරුද්දක් හා දින 8ක කාලයක් පැවති බව පිළිගැනීම සිදුව තිබේ.

එමෙන්ම මෙම පරීක්ෂණයේදී විධිමත් පරීක්ෂණ නිලධාරි විසින් නිර්දේශකර ඇති දඬුවම් හා එම දඬුවමට විරුද්ධව අභියාචනා මණ්ඩලය විසින් අභියාචනය අවසානයේ ලබාදී ඇති දඬුවම්ද මෙම විනය ව්‍යවස්ථා මාලාව හා එකඟ නොවේ.

විශේෂයෙන් විධිමත් විනය පරීක්ෂණය අවසානයේදී විනය නිලධාරි විසින් 2016.06.23 දින ලබාදී ඇති දඬුවම (X5) අනුව මාස එකක කාලයකට සේවය තාවකාලිකව අත්හිටු වීම වශයෙන් සටහන් කොට ඇති අතර වැඩ තහනම්ව කර සිටි කාලයට නොගෙවූ වැටුප් අහිමි කොට ඇත. ඒ අනුව සත්‍ය වශයෙන්ම 2016.02.01 සිට 2016.06.23 දක්වා මාස හතරකුත් දින විසිතුනක වැටුප ඔහුට අහිමි වේ. ඒ අනුව එම දඬුවම තේරුම් ගැනීම අපහසුය. විනය නියෝගයක් පැහැදිලි හා නිශ්චිත විය යුතුය. එම පැහැදිලි බව හා නිශ්චිත බව මෙම විනය නියෝගයේ දක්නට නොමැති වීම විශේෂ කරුණක් සේ දකිමි.

පළමුවන පාර්ශ්වකරු තමා වෙත ලබාදුන් විනය නියෝගයට එරෙහිව කරන ලද අභියාචනයට අදාළව ලබාදුන් අභියාචන නියෝගය 2017.06.12 වන දින (X6) ලබාදී ඇති අතර එහි සඳහන් වන්නේ, සේවය තහනමට ලක්ව සිටි කාලය දඬුවමකට යටත් කිරීමයි. ඒ අනුව පළමුවන පාර්ශ්වය 2016.02.01 සිට 2017.02.09 දක්වා කාලය වැඩ තහනමට ලක්වීම දඬුවමක් ලෙස නියෝගකර ඇත. නමුත් මා විසින් ඉහත දැක්වූ පරිදි විනය ව්‍යවස්ථා මාලාවේ අංක 10.1(viii) අනුව තාවකාලික වැඩ තහනම මාස හයක උපරිමයකට යටත් විය යුතුය. විනය ව්‍යවස්ථා මාලාවේ ( 10.1 (viii) ) ඒ අනුව අභියාචනා මණ්ඩලයේ නියෝගය ද විනය ව්‍යවස්ථා මාලාවට පටහැනිය. එබැවින් එම නියෝගය ප්‍රතික්ෂේප කරමි. පළමුවන පාර්ශ්වකරු වෙනුවෙන් ලබා දුන් අභියාචනා තීරණය ප්‍රතික්ෂේප කළද 2016.06.23 වන දින ලබාදුන් විනය නියෝගය පැහැදිලි හා නිශ්චිත එකක් නොවූවද පළමුවන පාර්ශ්වකරු විසින් කම්කරු කොමසාරිස් ජනරාල් වෙත කරන ලද අභියාචනය අනුව මා වෙත 2024.07.23 වන දින ලබාදී ඇති යොමුව අනුව එම නියෝගයේ එක් මසක වැඩ තහනම නිවැරදි බවට ඔහු පිළිගෙන ඇති නිසා එයද මෙම ප්‍රදානයේදී සැලකිල්ලට ගනිමි.

ඉහත සියලු කරුණු සලකා බැලීමෙන් අනතුරුව පළමුවන පාර්ශ්වකරුගේ රාජකාරි වැඩ තහනම් කළ 2016.02.01 දින සිට ඔහු නැවත සේවයේ පිහිටු වූ 2017.02.09 දක්වා වූ වසරකුත් දින අටක කාලයක් පළමුවන පාර්ශ්වකරුගේ රාජකාරි වැඩ තහනම් කිරීම කර තැබීම ලංකා ගමනා ගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථා මාලාවට පටහැනි බව තීරණය කරමි.

පළමුවන පාර්ශ්වය විසින් 2024.09.13 වන දින ගොනු කරන ලද ලිඛිත ප්‍රකාශය සමඟ අමුණා ඇති X8 දරන ඔහුගේ මාසික වැටුප් ලේඛනය ඉදිරිපත් කරමින් එම ලිඛිත ප්‍රකාශයේ අංක 10 යටතේ පළමු වන පාර්ශ්වකරුගේ වැඩ තහනමට පෙර මාසික වැටුප රුපියල් 40,632.00 ක් බව ප්‍රකාශකර සිටී. එම වැටුප සම්බන්ධව දෙවන පාර්ශ්වය විරෝධතාවයක් ඉදිරිපත්කොට නොමැත. ඒ අනුව අයුතු සහගත ලෙස රාජකාරි වැඩ තහනම අවුරුදු 1යි දින 8 ක් වූ කාලයෙන් (2016.02.01 සිට 2017.02.09 දක්වා ) කාලයෙන් 2016.06.23 වන දින ලබා දුන් විනය නියෝගය අනුව දඬුවම වශයෙන් එක් මාසයක තාවකාලිකව වැඩ තහනමක් ලබාදී ඇති නිසා එම මාසයක කාලය අඩු කළ පසු මාස 11යි දින 8 ක කාලයක් පළමුවන පාර්ශ්වකරු අයුතු සහගත ලෙස රාජකාරි වැඩ තහනම් කර ඇති බව තීරණය කරමි. ඒ අනුව එම මාස 11යි දින 8ක කාලය සඳහා ඔහුට වැටුප් හා වෙනත් ව්‍යවස්ථාපිත දීමනා ලබා ගැනීමට හිමිකමක් ඇති බව තීරණය කරමි.

මෙම මුදලට අමතරව 2024.10.08 වන දින බේරුම්කරණ විභාගය සඳහා දෙපාර්ශ්වය කැඳවා තිබුණද පළමුවන පාර්ශ්වය බිබිල ප්‍රදේශයේ සිට පැමිණ සිටිය ද දෙවන පාර්ශ්වය නොපැමිණීම හේතුවෙන් පළමුවන පාර්ශ්වයට සිදු වූ අසාධාරණය හේතුවෙන් රුපියල් 7500.00 ක ගාස්තුවක් දඩයක් වශයෙන් මා නියමකර අතර එයද මෙම ප්‍රදානය සඳහා එකතු කරමි.

ඒ අනුව පළමුවන පාර්ශ්වකරුට මෙම ප්‍රදානයෙන් පහත සඳහන් මුදල හිමි බව තීරණය කරමි.

| | |
|---|---|
| 1.1) මාස 11 ක් සඳහා හිමිවිය යුතු වැටුප | රු 40,632.00X11=446.952.00 |
| 1.2) දින 8ක් සඳහා හිමිවිය යුතු වැටුප | රු.40.632.00÷24X8=13.544.00 |
| 1.3) බේරුම්කරණ දඩය | රු.7500.00 |
| එකතුව ( 1.1 + 1.2+ 1.3) | <u>රු.467,996.00</u> |

ඉහත ගණනය කිරීමේදී වාර්ෂික වැටුප් වර්ධකය ඇතුලත්කර නොමැත. යම් හෙයකින් මෙම ප්‍රදානයට අදාළ කාලසීමාව තුළ වැටුප් වර්ධක දිනය එළඹෙන්නේ නම් එම මුදලද ඉහත ප්‍රදානයට ඇතුලත් විය යුතු වේ. මෙම මුදල ගණනය කිරීම මා විසින් ඉහත සවිස්තරව දැක්වූ විශ්ලේෂණය අනුව ඉතා සාධාරණව හා යුක්ති සහගතව සිදුකළ බව ප්‍රකාශ කරමි.

ඉහත ප්‍රදානය හේතු කොට ගෙන මෙම පළමුවන පාර්ශ්වකරුට හිමි වැටුපට අමතරව ඊට අදාළ ව්‍යවස්ථාපිත දීමනා ලබාගැනීමේ හිමිකමක් පවතින බවත් මෙම බේරුම්කරණයේ ප්‍රදානය වශයෙන් නියම කරනු ලබන රුපියල් හාරලක්ෂ හැටහත් දහස් නවසිය අනූහයක (රු.467.996.00) මුදල මෙම ප්‍රදානය *ගැසට්* ගත වී මසක් ඇතුලත මොණරාගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට නියම කරමි.

ඉහත ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත බව සහතික කරමි.

නීතිඥ ඩබ්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

2025 අප්‍රේල් මස 09 වැනි දින.

E0G 07-0360